

# ඉහළින් පිහිට

සැකසුම

වොට්සන් ගුඩ්මන්

නොමිලයේ - විකිණීමට නොවේ

# ඉහළින් පිහිට

"**ඉහළින් පිහිට**" ඒ ඒ මාතෘකාවන් යටතේ, බයිබලයේ නොයෙක් කොටස්වලින් රැස්කරගත්, එකිනෙකට සම්බන්ධ ශුද්ධ ලියවිලිය. ශුද්ධ ලියවිලි විස්තර ප්‍රකාශය සඳහා බයිබලයම ඉතා උචිත බව මාගේ දැඩි විශ්වාසයයි.

දෙවියන්වහන්සේගේ වචනය "**ඉහළින්**" පැමිණෙන බැවින් ධර්මිෂ්ඨකමට කුසගින්නක් හා පිපාසයක් ඇති හදවත්වලට මෙය අතිශයින් උපකාර වෙයි. යම් කිසිවෙක් සැබවින්ම පසුතැවිලි වී, පාපය අත්හැර, තම හද තුළ වාසය කිරීම පිණිස ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ආරාධනාකර උන්වහන්සේව සිය ගැළවුම්කරු ලෙස මුළු සිතින් විශ්වාස කරන්නෙහි නම් ඒ තැනැත්තාට ස්වාමින්වහන්සේ ප්‍රකාශ වී, තමන්වහන්සේගේම සතුට හා සාමය එම ළයෙහි නිරතුරුව ස්ථිර කරනසේක. 1937දී මෙය අත්දුටු මා එතැන් සිට ස්වාමින්වහන්සේ සමග ඇති මෙම යහපත්, මවිත සබඳතාවය කිසි කලෙකත් බිඳ නොදැමීය. ඔබ උන්වහන්සේව පිළිනොගෙන සිටී නම් මෙදැන්ම උන්වහන්සේව ඔබේ ගැළවුම්කරු හා ස්වාමින් ලෙස පිළිගැනීම පිණිස මම ඔබව ඉතා ආදරයෙන් දිරි ගන්වමි.

— වොට්සන් ගුඩ්මන් —

# දේව ප්‍රේමය



රෝම 5 : 8

නුමුත් දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ මරණය විඳීමෙන්ය.

යොහන් 13 : 1

පාස්කු මංගල්‍යයට පළමුවෙන්, යේසුස් වහන්සේ මේ ලෝකයෙන් පිටත්ව පියාණන්වහන්සේ ළඟට යන තමන්ගේ පැය පැමිණ තිබෙන බව දැන, ලෝකයෙහි සිටි සිය සෙනඟට ප්‍රේමයෙන් සිට අන්තිමය දක්වා ඔවුන්ට ප්‍රේම කළසේක.

එළිදරව් 1 : 5

විශ්වාස සාක්ෂිකාරයා වූ, මළවුන් ගෙන් නැගිටි කුළුඳුලා වූ, පොළොවේ රජුන්ගේ අධිපතියා වූ,......අපට ප්‍රේම කරන්නා වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, තමන් ලෙයින් පාපයෙන් අප මිදූසේක.

යොහන් 3 : 16

මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළසේක. එසේ කළේ උන් වහන්සේ කෙරෙහි අදහගන්න සැම දෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය.

යෙරෙමියා 31 : 3

**ස්වාමින්වහන්සේ** පුරාණයේදී මට ප්‍රකාශ වී: එසේය, සදාකාල ප්‍රේමයකින් නුඹට ප්‍රේම කළෙමි. එබැවින් දයාබර කමින් නුඹ ඇදගතිමියි කීසේක.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දේවත්වය

### 1 තිමෝති 3 : 16

දේව භක්තියේ රහසද නිසැකවම මහත්ය: උන්වහන්සේ මාංසයෙහි ප්‍රකාශ වූසේක; ආත්මයෙහි ධර්මිෂ්ඨව ඔප්පු වූසේක; දූතයන්ට පෙණුනුසේක. අන්‍ය ජාතීන් අතරේ ප්‍රකාශ කරනු ලැබූසේක; ලෝකයෙහි අදහනු ලැබූසේක; තේජසට ඔසවාගනු ලැබූසේක.

### මතෙව් 1 : 22,23

බලව, කන්‍යාව ගර්භනීව පුත්‍රයකු ප්‍රසූත කරයි; උන්වහන්සේට එම්මානුවෙල් යන නාමය තබනවා ඇත කියා ස්වාමින්වහන්සේ අනාගතවක්තෘ ලවා කියෙවූ කීම සම්පූර්ණ වන පිණිසය. ඒ නාමයේ අර්ථය නම් දෙවියන්වහන්සේ අප සමගය යනුයි.

### යොහන් 14 : 9,10අ

යේසුස්වහන්සේ ඔහුට කියනසේක්: පිලිප්, මා මෙපමණ කල් නුඹලා සමග සිටලත් මා අඳුනන්නේ නැද්ද? මා දුටු තැනැත්තේ පියාණන්වහන්සේ දුටුවේය; එසේ වී නම් පියාණන්වහන්සේ අපට පෙන්නුව මැනවයි නුඹ කියන්නේ කෙසේද? මා පියාණන්වහන්සේ තුළත්, පියාණන්වහන්සේ මා තුළත් සිටින බව විශ්වාස කරන්නේ නැද්ද?

### යොහන් 1 : 1 සහ 14

පටන්ගැන්මේදී වාක්‍යාණෝ සිටිසේක. වාක්‍යාණෝ දෙවියන්වහන්සේ සමග සිටිසේක. වාක්‍යාණෝ දෙවියන්වහන්සේව සිටිසේක. තවද වාක්‍යාණෝ මාංසවත් වී, කරුණාවෙන්ද සත්‍යයෙන්ද පූර්ණව අප අතරෙහි වාසය කළසේක.

# යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය

1 යොහන් 4 : 15

යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව යමෙක් ඒත්තු ගන්නේද, දෙවියන්වහන්සේ ඔහු තුළත්, ඔහු දෙවියන්වහන්සේ තුළත් ඇත්තේය.

කොළොස්සි 2 : 9

මක්නිසාද උන්වහන්සේ (ක්‍රිස්තුස් යේසුස්වහන්සේ) තුළ දේවත්වයේ සියලු සම්පූර්ණකම ශරීරාකාරයෙන් වාසය කරන්නේය.

යෙසායා 9 : 6

මක්නිසාද, අපට ළදරුවෙක් උපන්නේය, අපට පුත්‍රයෙක් දෙන ලද්දේය; ආණ්ඩුවද උන්වහන්සේගේ කර පිට තිබෙන්නේය. උන්වහන්සේගේ නාමය අපූර්වය, මන්ත්‍රීවරයාය, පරාක්‍රමවත් දෙවියන්වහන්සේය, සදාකාල පියාණෝය, සාමයේ කුමරාය කියනු ලබන්නේය.

ලූක් 1 : 35

දේවදූතයා ඇට උත්තර දෙමින්: ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹ කෙරෙහි පැමිණෙනසේක. මහෝත්තමයාණන්ගේ ආනුභාවයද නුඹ වසාගන්නේය. එනිසා උපදින්ට සිටින තැනැත්තේ ශුද්ධය, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝ යයි කියනු ලබනසේක.

මතෙව් 17 : 5

ඔහු කථා කරද්දීම දීප්තිමත් වළාපටල යක් ඔවුන් මත්තෙහි පැතිර තිබුණේය. බලව, මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. ඔහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි; ඔහුට ඇහුම්කන් දෙන්නැයි වළාපටලයෙන් හඬක් විය.

# 4 උන්වහන්සේ කවරෙක්ද කියා යේසුස්වහන්සේ අපට පවසති

යොහන් 8 : 23

උන්වහන්සේද : නුඹලා පහළින් වන්නහුය. මම ඉහළින් වෙමි. නුඹලා මේ ලෝකයෙන් වන්නහුය; මම මේ ලෝකයෙන් නොවෙමි.

යොහන් 11 : 25

යේසුස්වහන්සේ: නැවත නැගිටීමද ජීවනයද මමය. මා කෙරෙහි අදහාගන්නා මළ නුමුත් ජීවත් වන්නේය.

යොහන් 13 : 13

ආචාරිනි, ස්වාමිනි, කියා නුඹලා මට කියහුය. නුඹලා කියනවා හරිය. මක්නිසාද මම එසේ වෙමි.

යොහන් 9 : 5

මා ලෝකයෙහි සිටින කල මම ලෝකයේ ආලෝකයව සිටිමියි කීසේක.

යොහන් 6 : 35

යේසුස්වහන්සේ ඔවුන්ට කියනසේක්: ජීවනදයක කෑම නම් මමය. මා ළඟට එන්නාට බඩගිනි නොවන්නේය. මා කෙරෙහි අදහන්නාට කිසිකලකත් පිපාසා නොවන්නේය.

යොහන් 8 : 58

යේසුස්වහන්සේ ඔවුන්ට කථාකොට : සැබවක් සැබවක් නුඹලාට කියමි, ආබ්‍රහම් උපදින්ට පළමුවෙන් මම සිටිමියි කීසේක.

යොහන් 10 : 7

එනිසා යේසුස්වහන්සේ නැවත ඔවුන්ට කියනසේක්: සැබවක් සැබවක් නුඹලාට කියමි. බැටළුවන්ගේ දෙරකඩ මමය.

# යේසුස්වහන්සේ කළ හාස්කම් කීපයක් 

මතෙව් 14 : 19 – 21

උන්වහන්සේ සමූහයාට තණ කොළ පිට හිඳගන්ට අණකර, රොටි පහත් මසුන් දෙදෙනාත් ගෙන, ස්වර්ගය දෙස බලා ආශීර්වාද කොට, රොටි කඩා ගෝලයන්ට දුන්සේක. ගෝලයෝද සමූහයන්ට දුන්හ. සියල්ලෝම කා තෘප්තියට පැමිණියෝය. ඔවුහු කෑඩු කැබලිවලින් ඉතිරි ඒවා රැස්කර පැස් දෙළොසක් පුරවා ගත්තෝය. ස්ත්‍රීන්ද දරුවන්ද හැර කෑවාවූ පුරුෂයෝ පන්දහසක් පමණ වූහ.

ලූක් 5 : 5,6

සීමොන් උත්තර දෙමින් : ස්වාමිනි අපි මුළු රාත්‍රියෙහිම වෙහෙසවීමුව. නුමුත් කිසිත් ඇල්ලුවේ නැත. එහෙත් ඔබගේ වචනය නිසා දැල් හෙළමියි කීවේය. ඔවුන් එසේ කළ විට මසුන් මහත් රාශියක් අසුවිය. ඔවුන්ගේ දැල් ඉරෙන්ට පටන් ගත්තේය.

මතෙව් 20 : 30 සහ 34

පාර අද්දර හිඳගෙන සිටි අන්ධයන් දෙදෙනෙක් යේසුස්වහන්සේ ඒ ළඟින් යන බව අසා : ස්වාමිනි, දාවිත්ගේ පුත්‍රය අපට කරුණා කළ මැනවයි කෑගැසූහ... යේසුස්වහන්සේ ඔවුන්ට අනුකම්පාකර ඔවුන්ගේ ඇස් අතගෑසේක. එවලේම ඔව්හු පෙනීම ලැබ උන්වහන්සේ අනුව ගියෝය.

# 6 යේසුස් ක්‍රිස්තුන්වහන්සේ මැවුම්කරු හා ස්වාමින්ය

කොලොස්සි 1 : 16

මක්නිසාද සිංහාසන වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා, ස්වර්ගවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන දෙයද නොපෙනෙන දෙයද යන සියල්ල උන්වහන්සේ තුළ මවන ලද්දේය; සියලු දෙය උන්වහන්සේ කරණකොටගෙනද උන්වහන්සේ උදෙසාද මවා තිබේ.

හෙබ්‍රෙව් 1 : 2

දෙවියන්වහන්සේ. . . මේ දවස්වල කෙළවරදී තමන්වහන්සේගේ පුත්‍රයාණන් ලවා අපට කථා කළසේක. උන්වහන්සේව සියල්ලට උරුමක්කාරයා කළසේක. උන්වහන්සේ කරණකොටගෙන ලෝකවල් සෑදූසේක.

රෝම 14 : 9

මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ නැසුණෙත් නැවත ජීවත් වුණෙත් මළවුන්ගේද ජීවතුන්ගේද ස්වාමින්වහන්සේ වන පිණිසය.

යොහන් 1 : 3

උන්වහන්සේ විසින් සියල්ල සාදන ලද්දේය; සාදන ලද කිසිත් උන්වහන්සේ නැතුව සාදනු නොලද්දේය.

1 කොරින්ති 1 : 9

ස්වකීය පුත්‍රවූ අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සහභාගිකමට නුඹලා කැඳවාගත් දෙවියන්වහන්සේ විශ්වාසවසිටිනසේක.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සියල්ලන්ගේම විනිශ්චයකරුය



රෝම 14 : 10

නුඹ නුඹේ සහෝදරයා විනිශ්චය කරන්නේ මක්නිසාද? නොහොත් නුඹ නුඹේ සහෝදරයා කුමක් පිණිස සුළු කොට සිතන්නෙහිද? මක්නිසාද අපි සියල්ලෝම දෙවියන්වහන්සේගේ විනිශ්චය ආසනය ඉදිරියෙහි පෙනී සිටින්නෙමුව.

මතෙව් 25 : 32

සියලු ජාතීන් උන්වහන්සේ ඉදිරියට රැස්කරනු ලැබේ. එඬේරෙකු එළුවන්ගෙන් බැටළුවන් වෙන් කරන සේ, උන්වහන්සේ ඔවුන් වෙන් කරනසේක.

යොහන් 5 : 23අ

පියාණන්වහන්සේ කිසිවකු විනිශ්චය නොකොට සියලු විනිශ්චයම පුත්‍රයාට දී තිබේ.

රෝම 2 : 12

එබැවින් මාගේ ශුභාරංචියේ ප්‍රකාරයට දෙවියන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්-වහන්සේ ලවා මනුෂ්‍යයන්ගේ රහස් විනිශ්චය කරවන දවසේදී..........

2 තිමෝති 4 : 1

දෙවියන්වහන්සේ ඉදිරියේද, ජීවත්ව සිටින්නන් හා මළවුන් විනිශ්චය කිරීමට සිටින ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඉදිරියේද, එතුමාගේ ප්‍රකාශවීම හා එතුමාගේ රාජ්‍යයේ නාමයෙන් මා විසින් ඔබට අණ කරනු ලැබේ.

ක්‍රියා 10 : 42

ජීවත්වන්නන්ටද මළවුන්ටද විනිශ්චය කරු වන පිණිස දෙවියන්වහන්සේ විසින් නියම කළ තැනැත්තේ මුන්වහන්සේ බව සෙනඟට ප්‍රකාශකරන්ටත් සාක්ෂි දෙන්-ටත් උන්වහන්සේ අපට අණ කළසේක.

# මිදීම ක්‍රිස්තුස්වහන්සේ තුළින් පමණය

### යොහන් 10 : 9

දෙරකඩ නම් මමය. යමෙක් මා කරණ කොටගෙන ඇතුල් වේද, ඔහු ආරක්ෂා කරනු ලැබ ඇතුලට සහ පිටතට ගොස් ගොදුරු ලබන්නේය.

### යොහන් 14 : 6

යේසුස්වහන්සේ ඔහුට කියනසේක් : මාර්ගයද සැබෑවද ජීවනයද මමය. මා තුළින් මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙත පැමිණෙන්නේ නැත.

### යොහන් 8 : 24

එහෙයින්, නුඹලාගේ පාපවල නුඹලා නැසෙන බව නුඹලාට කියමි. මක්නිසාද ඒ මමයයි නුඹලා විශ්වාස කළොත් මිස නැත්නම් නුඹලාගේ පාපවල නුඹලා නසින්නහු යයි කීසේක.

### හෙබ්‍රෙව් 5 : 9

මෙසේ උන්වහන්සේ සම්පූර්ණ කරනු ලැබ. . . තමන්වහන්සේට කීකරු වෙන්නාවූ සියල්ලන්ටම සදකාල ගැළවීමේ කර්තෘ වූසේක.

### හෙබ්‍රෙව් 7 : 25

උන්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ වෙත ළඟා වෙන්නන් උදෙසා මැදහත්කම් කරන පිණිස උන්වහන්සේ නිරතුරුම ජීවත්වන හෙයින්, ඔවුන් කෙළවර දක්වාම ගළවන්ට උන්වහන්සේට පුළුවන.

### ක්‍රියා 4 : 12

වෙන කිසිවෙකු තුළ ගැළවීම නැත්තේය. මක්නිසාද අපේ ගැළවීමට අවශ්‍ය වූ, මනුෂ්‍යයන් අතරේ දෙන ලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත්තේයයි කීවේය.

# මිදීම ක්‍රිස්තුස්වහන්සේ තුළින් පමණය 

කොලොස්සි 1 : 12 – 14

ආලෝකයේ සිටින ශුද්ධවන්තයන්ගේ උරුමයෙන් කොටසකට අප සුදුස්සන් කළා වූ පියාණන්වහන්සේට ස්තුති කරමින්ද, නුඹලා ස්වාමින්වහන්සේට ඔබින ලෙස සියලු ආකාරයෙන් ප්‍රසන්නව හැසිරෙන ලෙස ඉල්ලමුව. පියාණන්වහන්සේ අන්ධකාරයේ බලයෙන් අප මුදා තමන් ප්‍රේමයේ පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අප පමුණුවා ගත්සේක. උන්වහන්සේගේ ලෙය තුළින් අපගේ මිදීම වන පව්වලට කමාව අපට තිබේ.

ලූක් 19 : 10

මක්නිසාද මනුෂ්‍ය පුත්‍රයා නැති වූ දේ සොයන්ටද ගළවාගන්ටද ආයේ යයි කීසේක.

1 කොරින්ති 1 : 30

නුමුත් උන්වහන්සේ කරණකොටගෙන නුඹලා ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සිටින්නහුය. ඒ තැනැන්වහන්සේ දෙවියන්වහන්සේගෙන් අපට ප්‍රඥාව එනම් ධර්මිෂ්ඨකමද ශුද්ධකමද මිදීමද කරනු ලැබූසේක.

තීතස් 2 : 14

උන්වහන්සේ සියලු අධර්මිෂ්ඨකමින් අප මුදා, යහපත් ක්‍රියා ගැන ජ්වලිතවූ සෙනඟක් ස්වකීය සම්පතක් කොට පවිත්‍ර කරගන්නා පිණිස අප උදෙසා තමන්ම දුන්සේක.

# පාපයෙන් නිදහස් කරන ක්‍රිස්තුස්වහන්සේගේ ලෙයේ වන්දිය

රෝම 5 : 9

එබැවින් ක්‍රිස්තුස්වහන්සේගේ ලෙය කරණකොටගෙන ධර්මිෂ්ඨ කරනු ලැබූ අපි උන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ උදහසින් ගළවනු ලබන්නෙමුව.

එපීස 1 : 7ආ

. . . උන්වහන්සේගේ ලේ කරණකොට ගෙන අපේ මිදීම වන අපේ වරදවලට කමාව අපට ඇත්තේය.

1 යොහන් 1 : 7

නුමුත් උන්වහන්සේ ආලෝකයෙහි සිටින්නා සේම අපිත් ආලෝකයෙහි හැසිරෙමු නම්, අපට එකිනෙකා සමග පංගුකාරකම ඇත. උන්වහන්සේගේ පුත්‍ර වූ යේසුස්වහන්සේගේ ලෙය ද සියලු පාපවලින් අප පවිත්‍ර කරන්නේය.

1 පේත්‍රුස් 1 : 18,19

මක්නිසාද නුඹලාගේ පියවරුන්ගෙන් ලැබූ නුඹලාගේ නිෂ්ඵල හැසිරීමෙන් නුඹලා මුදනු ලැබුවේ රන් රිදී වැනි දිරා යන දේවල් කරණකොටගෙන නොව, කැළලක්වත් පලුද්දක්වත් නැති බැටළු පැටවෙකුගේ ලේ වැනි ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝ ලෙය කරණකොටගෙන බව නුඹලා දන්නහුය.

හෙබ්‍රෙව් 9 : 14

කැළලක් නැතුව සදකාල ආත්මයාණන් කරණකොටගෙන තමන්ම දෙවියන් වහන්සේට පූජා වූ ක්‍රිස්තුස්වහන්සේගේ ලෙයින් ජීවමාන දෙවියන්වහන්සේට සේවය කරන පිණිස මළ ක්‍රියාවලින් නුඹලාගේ හෘද සාක්ෂිය කොපමණ වැඩියෙන් පිරිසිදු කරනු නොලබන්නේද?

# ගැළවීම ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහීමෙන්ය

එපීස 2 : 8,9

මක්නිසාද ඇදහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය. එය නුඹලාගෙන් නොව, දෙවියන්වහන්සේගේ දීමනාවය. කිසිවෙක් පාරට්ටුකර නොගන්නා පිණිස එය ක්‍රියාවලින් නොවේ.

රෝම 5 : 1

එබැවින් අපි ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨ කරනු ලැබ, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන දෙවියන් වහන්සේ හා සමග සමාදනය ඇතුව සිටිමු.

ගලාති 5 : 6

මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රේමය කරණකොටගෙන ක්‍රියා කරන ඇදහිල්ලෙන් මිස චර්මඡේදායෙන්වත් අචර්මඡේදායෙන්වත් ප්‍රයෝජනයක් නැත.

යොහන් 20 : 31

නුමුත් මේවා ලියන ලද්දේ යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රවූ ක්‍රිස්තුස්වහන්සේ බව නුඹලා විශ්වාස කරන පිණිසත් විශ්වාසකොට උන්වහන්සේගේ නාමයෙන් ජීවනය ලබන පිණිසත්ය.

යොහන් 6 : 28,29

එබැවින් ඔවුහු කථාකොට : දෙවියන්වහන්සේගේ වැඩ ඉෂ්ඨ කරන පිණිස අප කුමක් කළ යුතුදැයි උන්වහන්සේගෙන් ඇසුවෝය. යේසුස්වහන්සේ උත්තර දෙමින් : දෙවියන්වහන්සේගේ වැඩය නම් උන්වහන්සේ විසින් එවූ තැනැත්තා කෙරෙහි නුඹලා විසින් අදහාගැන්ම යයි කීසේක.

# දේව කරුණාව

## ගීතාවලිය 103 : 11

මක්නිසාද පොළොවට උඩින් අහස උස්ව තිබෙන්නාක් මෙන් උන්වහන්සේ කෙරෙහි භය ඇත්තන්ට උන්වහන්සේගේ කරුණාව මහත්ය.

## ගීතාවලිය 103 : 17

නුමුත් **ස්වාමින්වහන්සේගේ** කරුණාව තමන්ට භය ඇත්තන් කෙරෙහි සදාකාල යෙන් සදාකාලයටද, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම, දරුවන්ගේ දරුවන්ටද පවත්නේය.

## මීකා 7 : 18

අපරාධය කමා කරන්නාවූ, ස්වකීය උරුමයේ ඉතිරි අයගේ වරදට දඬුවම් නොකර අරින්නාවූ ඔබවහන්සේ සමාන දෙවිකෙනෙක් කවුද? උන්වහන්සේ කරුණාවට ප්‍රියවන නිසා ස්වකීය උදහස සැම කල්හිම තබා නොගන්නාසේක.

## ගීතාවලිය 108 : 4

මක්නිසාද ඔබගේ කරුණාව ස්වර්ගය ඉක්මවා මහත්ව තිබේ. ඔබගේ සත්‍යයද අහසද දක්වා පවත්නේය.

## විලාප ගී 3 : 22,23

අප විනාශ නූණේ **ස්වාමින්වහන්සේගේ** කරුණාව නිසාත් උන්වහන්සේගේ අනුකම්පාව නොනවතින නිසාත්ය. ඒවා උදයෙන් උදය අලුත්ව තිබේ; ඔබගේ විශ්වාසකම මහත්ය.

## තීතස් 3 : 5

අප කළ ධර්මිෂ්ඨ ක්‍රියා නොව, තමන්වහන්සේගේ දයාව ලෙස නැවත ඉපදීම නැමති සේදීමෙන්ද ශුද්ධාත්මයාණන්වහන්සේගේ අලුත් කිරීමෙන්ද උන්වහන්සේ අප ගැළවූසේක.

මතෙව් 11 : 28

වෙහෙස වෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි, මා වෙත එන්න. මම නුඹලාට සහනය දෙමි.

යෙසායා 55 : 1

එම්බා පිපාසය ඇති සියල්ලෙනි, වතුර අසළට පැමිණෙන්න, මුදල් නැත්තෙනි, නුඹලාත් පැමිණ ධාන්‍ය ගෙන කන්න; එසේය, ඇවිත් මිල මුදල් නැතුව මුද්‍රික පානයද කිරිද ගන්න.

යොහන් 7 : 37

මංගල්‍යයේ මහත් දවසවූ අන්තිම දවසේ යේසුස්වහන්සේ නැගිට, ශබ්ද නගා; යමෙකුට පිපාසය ඇත්නම් ඔහු මා ළඟට පැමිණ බීවාවේ යයි කීසේක.

එළිදරව් 22 : 17

ආත්මයාණන්වහන්සේද මනාලියද : එන්නැයි කියති. අසන්නාද : එන්නැයි කියත්වා. පිපාසය ඇත්තාද පැමිණෙත්වා. කැමති කෙනෙක් ජීවන වතුර නොමිලයේ ගනිත්වා.

යෙසායා 1 : 18

ඉතින් එන්න, අපි කාරණා කථා කරගනිමු යයි **ස්වාමින්වහන්සේ** කියනසේක. නුඹලාගේ පව් රතුපාටව තිබෙන නුමුත් ඒවා හිම මෙන් සුදු වන්නේය; ඒවා ලාක්ෂා මෙන් රතුව තිබෙන නුමුත් සුදු ලොම් මෙන් වන්නේය.

# සියල්ලෝම දේව දරුවෝ නොවෙති

## 1 යොහන් 3 : 10

මෙයින් දෙවියන්වහන්සේගේ දරුවෝ හා යක්ෂයාගේ දරුවෝ ප්‍රකාශව සිටිති. ධර්මිෂ්ඨකම් නොකරන්නෙක්වත් තම සහෝදරයාට ප්‍රේම නොකරන්නෙක්වත් දෙවියන්වහන්සේගෙන් නොවෙයි.

## රෝම 8 : 14,15

මක්නිසාද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ විසින් ගෙනයනු ලබන යම් පමණ දෙනෙක් ඇද්ද, එපමණ දෙනා දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය. මක්නිසාද නුඹලා භය උපදවන දසකමේ ආත්මය නැවත නොලබා පුත්‍රකමේ ආත්මය ලබාගත්තහුය; එයින් අපි : අබ්බා පියාණෙනි කියා හඬ ගසමුව.

## පිලිප්පි 2 : 14,15

වංක වූ හිතුවක්කාර පරම්පරාවක් අතර නුඹලා නිදෙස්ව, අහිංසකව, දෙවියන්වහන්සේගේ නිර්දෝෂ දරුවන්ව සිටින පිණිස, කෙඳිරීම්ද විවාදද නැතුව සියල්ල කරන්න. ඔවුන් අතරේ නුඹලා ආලෝක මෙන් ලෝකයෙහි බැබළිය යුතුය.

## 2 කොරින්ති 6 : 17,18

එබැවින් නුඹලා ඔවුන් අතරෙන් පිටතට ඇවිත්, වෙන්ව අපවිත්‍ර දෙයට අත නොගසා සින්ටිනැයි ස්වාමින්වහන්සේ කියනසේක. එවිට මම නුඹලා පිළිගෙන නුඹලාට පියෙක් වන්නෙමි; නුඹලාද මට පුත්‍රයොත් දූවරුත් වන්නහු යයි සර්වපරාක්‍රම ස්වාමීන් කියනසේක.

### ගලාති 5 : 19 – 21

ඉතින් මාංසයේ ක්‍රියා ප්‍රකාශව තිබේ. එනම් : වේශ්‍යාකම, අපවිත්‍රකම, සල්ලාලකම, රූප වැඳීම, මායාව, සතුරුකම, විවාදය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, පක්ෂවාදිකම, භේද, ලබ්ධිභේද, වෛරය, බීමත්කම, මංගල්‍ය සෝෂා හා තවත් එවැනි දේවල්ය. එබඳු දේ කරන්නාට දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ උරුම නොලැබෙන බව මම නුඹලාට ප්‍රථම කී ලෙසම දැනුත් කලින් නුඹලාට කියමි.

### යෙසායා 5 : 11

මද්‍යපානය පස්සේ යන පිණිස උදැසනම නැගිට්ටින්නාවූ, මුද්‍රිකපානයෙන් ඇවිලෙන ලෙස රෑ වෙන තුරු ප්‍රමාද වෙන්නා වූ අයට දුක්වේ.

### රෝම 13 : 13, 14

ක්‍රීඩා සෝෂාව සහ බීමත්කමෙන් හෝ සල්ලාලකම සහ අනාචාරයෙන් හෝ ඩබර සහ ඊර්ෂ්‍යාවෙන් හෝ නොහැසිර, දවාලෙහි මෙන් ඔබින ලෙස හැසිරෙමු. නුමුත් තෘෂ්ණා පූර්ණ කරන පිණිස මාංස යට පංගාඩමක් නොකොට, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පැළඳගන්න.

### හිතෝපදේශ 23 : 31,32

මුද්‍රික පානය රතුව පෙනෙන විටත්, පාත්‍රයෙහි දිළිසෙන විටත්, සිනිඳු ලෙස වැක් කෙරෙන විටත්, ඒ දෙස නොබලන්න. අන්තිමේදී එය සර්පයෙකු මෙන් හපා කා, පොළඟෙකු මෙන් දෂ්ට කරයි.

# අවංකකම ප්‍රමාණවත් නොවේ

මතෙව් 22 : 37,38

ඔබේ මුළු හෘදයෙන්ද ඔබේ මුළු ආත්මයෙන්ද ඔබේ මුළු බුද්ධියෙන්ද ඔබේ දෙවි වූ ස්වාමින්වහන්සේට ප්‍රේම කරන්න. මෙය උතුම් වූ පළමුවෙනි ආඥාවය.

මාර්ක් 10 : 17 – 22

. . . යහපත් ආචාරිනි, සදාකාල ජීවනය උරුම කරගන්නා පිණිස මා කුමක් කළ යුතුදැයි උන්වහන්සේගෙන් ඇසුවේය. යේසුස්වහන්සේ ඔහුට කියනසේක් : මා යහපත් යයි නුඹ මට කියන්නේ මන්ද? එක්කෙනෙක්, එනම්, දෙවියන්වහන්සේ මිස වෙන කිසිවෙක් යහපත් නොවේ. මිනී නොමරන්න, කාමමිථ්‍යාචාරය නො කරන්න, සොරකම් නොකරන්න බොරු සාක්ෂි නොකියන්න, වංචා නොකරන්න. ඔබේ පියාටත් මවුටත් ගෞරව කරන්න යන මේ ආඥා ඔබ දන්නේ යයි කීසේක. ඔහුද : ආචාරිනි මේ සියල්ල මා යෞවන කල සිට පිළිපැද්දෙමියි උන්වහන්සේට කීය. යේසුස්වහන්සේ ඔහු දෙස බලා, ඔහුට ප්‍රේමකර: නුඹට එකක් අඩුය. ගොස් නුඹ සන්තක සියල්ල විකුණා දිළිඳුන්ට දෙන්න, එවිට ස්වර්ගයේ ඔබට වස්තුව ඇති වේ. ඔබ මා අනුව එන්නැයි ඔහුට කීසේක. එහෙත් ඔහුට බොහෝ සම්පත් තිබුණ බැවින් ඒ කීම නිසා ඔහුගේ මුහුණ මැළවී ශෝකයෙන් යන්ට ගියේය.

හිතෝපදේශ : 16 : 25

මනුෂ්‍යයාට හරිව පෙනෙන මාර්ගයක් ඇත; එහෙත් එහි කෙළවර නම් මරණයේ මාර්ගයය.

# මුළා නොවෙන්න

එපීස 5 : 6

හිස් වචනවලින් නුඹලා රවටන්ට කිසිවෙකුට ඉඩ නොදෙන්න. මක්නිසාද, මේ දේවල් නිසා දෙවියන්වහන්සේගේ උදහස අකීකරුකමේ පුත්‍රයන් පිටට පැමිණෙන්නේය.

1 කොරින්ති 6 : 9,10

නොහොත් අධර්මිෂ්ඨයන් දෙවියන්වහන්සේගේ රාජ්‍ය උරුම කරගන්නේ නැති බව නුඹලා දන්නේ නැද්ද? නොරැවටෙන්න, වේශ්‍යාකම්කරන්නෝවත් රූප වඳින්නෝවත් කාමමිථ්‍යාචාරිකයෝවත් ස්ත්‍රීන් ලෙස හැසිරෙන්නෝවත් පිරිමින් සමඟ අනාචාර කරන්නෝවත්, සොරුවත්, ලෝභයෝවත් බේබද්දෝවත් නින්ද කරන්නෝවත්, කොල්ලකන්නෝවත් දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකර නොගන්නෝය.

යාකොබ් 1 : 22

නුමුත් නුඹලාව රවටාගනිමින්, වචනය අසන්නෝ පමණක් නොවී එය පිළිපදින්නෝ වෙන්න.

1 යොහන් 3 : 7,8අ

මාගේ ප්‍රිය දරුවෙනි, නුඹලා මුළා කරන්ට කිසිවෙකුට ඉඩ නොදෙන්න. උන්වහන්සේ ධර්මිෂ්ඨව සිටින්නාක් මෙන් ධර්මිෂ්ඨකම් කරන්නා ධර්මිෂ්ඨව සිටියි. පව් කරන තැනැත්තා යක්ෂයාගෙන්ය; මක්නිසාද, යක්ෂයා පටන්ගැන්මේ සිට පව් කරන්නේය.

ගලාති 6 : 3

මක්නිසාද කිසිත් නොවන කෙනෙක් තමා වැදගත් කෙනෙක් යයි සිතන්නේ නම්, ඔහු තමාම රවටාගනියි.

# පාපය මරණය ගෙන එයි

රෝම 5 : 12

එහෙයින් එක් මනුෂ්‍යයෙකු කරණ කොටගෙන පාපයත් පාපය කරණකොට ගෙන මරණයත් ලෝකයට ඇතුල් වුණාක් මෙන් සියලු මනුෂ්‍යයන් පව් කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමිණුනේය.

යාකොබ් 1 : 15

එවිට තෘෂ්ණාව පිළිසිඳගත් කල පාපය ගෙන එයි; පාපය සම්පූර්ණ වූ කල මරණය උපදවයි.

රෝම 8 : 6

මාංසයේ ඇල්ම මරණයය; නුමුත් ආත්මයේ ඇල්ම ජීවනය හා සමාදනයය.

එසකියෙල් 18 : 20

පව් කරන ප්‍රාණය නසින්නේය. පුත්‍රයා පියාගේ අයුතුකම නොදරයි. පියාද පුත්‍රයාගේ අයුතුකම නොදරයි. ධර්මිෂ්ඨයාගේ ධර්මිෂ්ඨකම ඔහු පිට‍ටත් දුෂ්ඨයාගේ දුෂ්ඨකම ඔහු පිටටත් පැමිණෙන්නේය.

ලූක් 15 : 32

නුමුත් අප විසින් ප්‍රීති සන්තෝෂ වෙන්ට යුතුව තිබුණේය. මක්නිසාද මේ නුඹේ සහෝදරයා නැසී නැවත ජීවත්ව සිටියි; නැති වී සිට සම්භවී ඇතැයි කීසේක.

හිතෝපදේශ 11 : 19

ධර්මිෂ්ඨකමේ ස්ථිරව සිටින්නා ජීවනයට පැමිණෙන්නේය. නපුර අනුව යන්නා තමාට මරණය ළඟා කරගන්නේය.

# ක්‍රිස්තුස්වහන්සේ මරණය පරාජය කළසේක 

ලූක් 7 : 14,15අ

උන්වහන්සේ ළඟට ගොස් දෙනයට අතගැසූසේක. එවිට උසුලාගෙන යන්නෝ නැවතුණෝය. උන්වහන්සේ: යෞවනය, නැගිටින්නැයි නුඹට කියමියි කීසේක. එවිට මළාවූ ඔහු නැගිට කථා කරන්ට පටන්ගත්තේය.

යොහන් 11 : 43,44

උන්වහන්සේ මෙසේ කියා : ලාසරුස් පිටතට එන්න කියා මහත් ශබ්දයකින් කීසේක. මැරී සිටි තැනැත්තේ පිටත ආවේය; ඔහුගේ අත් පා වස්ත්‍රවලින් බැඳ, මුහුණද රෙදිකඩකින් ඔතා තිබුණේය. මොහු මුදා, යන්ට හරින්නැයි යේසුස්වහන්සේ ඔවුන්ට කීසේක.

යොහන් 10 : 17,18

මා විසින් නැවත ගන්නා පිණිස මාගේ ප්‍රාණය දෙන බැවින් මාගේ පියාණන්වහන්සේ මට ප්‍රේම කරනසේක. කිසිවෙක් එය මගෙන් උදුරා ගන්නවා නොව මම ම එය දෙමි. එය දීමට මට බලය තිබේ, නැවත ගන්ටද මට බලය තිබේ. මේ ආඥාව මාගේ පියාණන්වහන්සේගෙන් ලදිමියි කීසේක.

එළිදරව් 1 : 18

මම මැරුණෙමි, නුමුත් බලව මම දුන් සදකාලේටම ජීවත්ව සිටිමි. මරණයේද පාතාලයේද යතුරු මට ඇත්තේය.

# දේව පනත්

ද්විතීය 5 : 7 – 21

මා ඇර අන් දෙවිවරු ඇතිව නොසිටින්න.

කැපූ රූපයක්වත්, උඩ අහසේ හෝ පහත පොළොවේ හෝ පොළොවේ යට ජලයේ හෝ ඇති කිසිම දෙයක සමානත්වයක් ඔබට සාද නොගන්න, ඒවාට ඔබ නමස්කාර නොකරන්න, සේවය නොකරන්න.........

ඔබේ දෙවි වූ **ස්වාමින්වහන්සේගේ** නාමය නිකරුණේ භාවිතා නොකරන්න. මක්නිසාද, සිය නාමය නිකරුණේ භාවිතා කරන තැනැත්තාව වැරදිකරුවෙකු කර **ස්වාමින්වහන්සේ** ගණන් ගන්නාසේක.

ඔබේ දෙවි වූ **ස්වාමින්වහන්සේ** ඔබට අණ කළ සේ සබත් දවස ශුද්ධව පවත්වන්න. සය දිනක් වැඩකර, ඔබේ සියලු වැඩ කරගන්න.........

ඔබේ දෙවි වූ **ස්වාමින්වහන්සේ** ඔබට අණ කළ සේ ඔබේ පියාටද, ඔබේ මවටද ගෞරවය කරන්න.

මිනී නොමරන්න; කාමමිථ්‍යාචාර නොකරන්න; සොරකම් නොකරන්න; ඔබේ අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියන්න.

ඔබේ අසල්වැසියාගේ භාර්‍යාවටත්, නිවසටත් ඔහුගේ කෙතටත්, ඔහුගේ සේවකයාටත්, සේවිකාවටත්, ඔහුගේ ගවයාටත්, ඔහුගේ කොටළුවාටත්, ඔබේ අසල්වැසියාගේ කිසිම දෙයකටත් තණ්හා නොවෙන්න.

යෝබ් 34 : 21,22

මක්නිසාද උන්වහන්සේගේ ඇස් මනුෂ්‍යයාගේ මාර්ග කෙරෙහිය; ඔහුගේ සියලු යාම් ඊම් උන්වහන්සේ දක්නාසේක. අයුතුකම් කරන්නන්ට සැඟවී ඉන්ට පුළුවන්වූ අන්ධකාරයක්වත් මරණ සෙවණක්වත් නැත.

යෙරෙමියා 23 : 24

මට නොපෙනෙන ලෙස යමෙකුට රහස් තැන්වල සැඟවෙන්ට පුළුවන්දැයි **ස්වාමීන්වහන්සේ** කියනසේක. ස්වර්ගය සහ පෘතුවිය මාගෙන් පිරී තිබෙනවා නොවේදැයි **ස්වාමීන්වහන්සේ** කියනසේක.

හිතෝපදේශ 15 : 3

**ස්වාමීන්වහන්සේගේ** ඇස් සැමතැනම පැවත නපුරන්ද යහපතුන්ද බලන්නේය.

ගීතාවලිය 139 : 8 සහ 12

මම ස්වර්ගයට නැඟුණොත් නුඹුත් ඔබ එහිය. . . අන්ධකාරය ඔබගෙන් කිසිවක් නොසඟවයි, රාත්‍රියද දවාල මෙන් බබළයි. අන්ධකාරයත් එළියත් ඔබට එක සමානය.

ලූක් 8 : 17

මක්නිසාද, එළිදරව් කරනු නොලබා සඟවන දෙයක් නැත; නොහොත් දැනගනු නොලබන්නා වූ කිසි රහසක්ද නැත.

# අභක්තිකයාගේ සදාකාල දඬුවම

මතෙව් 13 : 41,42

මනුෂ්‍ය පුත්‍රයා සිය දූතයන් එවන සේක, ඔවුහු බාධා උපදවන සියල්ලද අයුතුකම් කරන්නන්ද උන්වහන්සේගේ රාජ්‍යයෙන් එක්කොට, ගිනි උදුනෙහි හෙළන්නෝය. එහිදී හැඬීමද දත්මිටි කෑමද වන්නේය.

මතෙව් 18 : 8

නුඹේ අත හෝ පය හෝ නුඹට බාධා කෙරේ නම් එය කපා අහක දමන්න. දෑත හෝ දෙපය හෝ ඇතුව සදාකාල ගින්නට හෙළනු ලැබීමට වඩා අබ්බාගාතව නොහොත් කොරව ජීවනයට පැමිණීම නුඹට යහපතය.

2 පේත්‍රුස් 3 : 7

නුමුත් දැන් පවතින අහසද පොළොවද එම වචනයෙන්, විනිශ්චයෙත් අභක්තිකයන්ගේ විනාශයේත් දවස දක්වා ඉතුරු කරනු ලැබ ගින්නෙන් දැවීමට තබා තිබේ.

ගීතාවලිය 9 : 17

දුෂ්ටයන්ද එසේය, දෙවියන්වහන්සේව අමතක කරන සියලු ජාතීන්ද ෂෙයෝල්ලට දමනු ලබන්නේය.

මතෙව් 25 : 46

ඔවුහු සදාකාල දඬුවමටත් ධර්මිෂ්ඨයෝ සදාකාල ජීවනයටත් යන්නෝ යයි කීසේක.

ක්‍රියා 17 : 31

මක්නිසාද තමන්වහන්සේ විසින් පත් කළ මනුෂ්‍යයා ලවා ලෝකයා ධර්මිෂ්ඨ කමින් විනිශ්චය කිරීමට එක් දවසක් නියමකර තිබේ; උන්වහන්සේ ඒ මනුෂ්‍යයා මළවුන්ගෙන් නැගිටවීමෙන් සියල්ලන්ට ඒ ගැන සහතිකයක් දී තිබේ යයි කීවේය.

2 පේත්‍රුස් 2 : 9අ, 10අ

භක්තිවන්තයන් පරික්ෂාවෙන් ගළවන්ටත් අධර්මිෂ්ඨයන්. . . දඬුවම යටතේ විනිශ්චය දවස දක්වා තබන්ටත් ස්වාමින්වහන්සේ දන්නාසේක.

1 යොහන් 4 : 17

අප තුළ ප්‍රේමය සම්පූර්ණව තිබීම නම් ඒ තැනැන්වහන්සේ සිටින ආකාරයටම අපත් මේ ලෝකයෙහි සිටින බැවින් විනිශ්චය දවසේ අපට එඩිතරව සිටීමට පුළුවන.

හෙබ්‍රෙව් 9 : 27

තවද එක වරක් මරණයත් ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියමව තිබේ.

2 කොරින්ති 5 : 10

මක්නිසාද එකිනෙකා තම තමාගේ ශරීරයේදී කළාවූ දේවල එල, ඒ දේ යහපත් වුවත්, අයහපත් වුවත්, කළ දේවල හැටියට ලබන පිණිස අපි සියල්ලන් ක්‍රිස්තුස්වහන්සේගේ විනිශ්චයාසනය ඉදිරියේ ප්‍රකාශවීමට ඕනෑය.

රෝම 14 : 12

එහෙයින් අප එක් එක්කෙනා තම තමා ගැන දෙවියන්වහන්සේට ගණන් දෙනවා ඇත.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාව

රෝම 5 : 15

නුමුත් වරද යම්සේද නොමිලයේ දීමනාව එසේ නොවේ. මක්නිසාද එක් කෙනෙකුගේ වරදෙන් බොහෝ දෙනා මළාහු නම්, ඊටත් වඩා දෙවියන්වහන්සේගේ කරුණාවෙන් වූ දීමනාවත් බොහෝ දෙනා සඳහා වැඩි වූයේය.

රෝම 9 : 16

එනිසා එය කැමතිවන තැනැත්තාගෙන්වත් දුවන තැනැත්තාගෙන්වත් නොව, දයාව පෙන්වන්නාවූ දෙවියන්වහන්සේගෙන්ය.

1 පේත්‍රුස් 5 : 5ආ

. . . මක්නිසාද දෙවියන්වහන්සේ උඩඟු අයට විරුද්ධව සිට යටහතුන්ට කරුණාව දෙනසේක.

2 කොරින්ති 8 : 9

මක්නිසාද අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාව, එනම් : උන්වහන්සේ ධනවත්ව සිටිය නුමුත්, තමන්වහන්සේගේ දිළිඳුකම කරණකොටගෙන නුඹලා ධනවත්වන පිණිස නුඹලා උදෙසා දිළිඳුවූ බව නුඹලා දන්නහුය.

2 කොරින්ති 9 : 15

දෙවියන්වහන්සේගේ කිව නොහැකි දීමනාව නිසා උන්වහන්සේට ස්තුති වේවා.

ක්‍රියා 4 : 33

ස්වාමිවූ යේසුස්වහන්සේගේ නැවත නැගිටීම ගැන ප්‍රේරිතයෝ මහත් බලයෙන් සාක්ෂි දුන්නෝය. මහත් අනුග්‍රහය ඔවුන් සියල්ලන් කෙරෙහි තිබුණේය.

# පසුතැවිලිවීම

## ක්‍රියා 17 : 30

ඉතින්, මෙම නොදන්නා කාලවල් දෙවියන්වහන්සේ නොබලා හැරිය නුමුත් සියලු මනුෂ්‍යයන්ට හැමතැන්හි පසුතැවිලි වෙන්ට දැන් අණ කරනසේක.

## ලූක් 13 : 3

එසේ නොවේ යයි නුඹලාට කියමි. පසුතැවිලි නූනොත් නුඹලා සියල්ලෝම එසේම විනාශ වන්නෝය.

## ක්‍රියා 3 : 19

එබැවින් ස්වාමීන්වහන්සේ ඉදිරියෙන් සැනසිලි කාලයන් පැමිණෙන ලෙසද. . . නුඹලාගේ පාපයන් මකාදමනු ලබන පිණිසද, පශ්චාත්තාපව හැරෙන්න.

## ක්‍රියා 2 : 38

පේත්‍රුස් : නුඹලා සියල්ලෝම පසුතැවිලිව පව් කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තීස්මය ලබන්න; එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය.

## 2 කොරින්ති 7 : 10

මක්නිසාද දේව කැමැත්තට එකඟවූ ශෝකය තැවෙන්ට කාරණයක් නොවී ගැළවීමට පමුණුවන පසුතැවිලිවීම හටගන්වයි. නුමුත් ලෞකික ශෝකය මරණය උපදවන්නේය.

## මතෙව් 3 : 2

පසුතැවිලි වෙන්න; මක්නිසාද, ස්වර්ග රාජ්‍යය ළඟ යයි කීවේය.

# පාප කමාව

මතෙව් 6 : 14

මක්නිසාද නුඹලා මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වරද කමා කරන්නහු නම් නුඹලාගේ ස්වර්ගීය පියාණන්වහන්සේ නුඹලාටත් කමා කරනසේක.

එසකියෙල් 18 : 21

නුමුත් දුෂ්ඨයා ඔහු කළ සියලු පාපවලින් හැරී, මාගේ සියලු පනත් පවත්වමින්, යුක්තියද ධර්මිෂ්ඨකමද කළොත් ඔහු සැබවින් නොනැසී ජීවත්වන්නේය.

එළිදරව් 3 : 20

මෙන්න, මම දෙර ළඟ සිට තට්ටුකරමි. යමෙක් මාගේ හඬ අසා දෙර ඇරියොත්, ඔහු වෙතට ඇතුල්ව, ඔහු සමග කෑම කන්නෙමි. ඔහු ද මා සමග කන්නේය.

යෙසායා 55 : 7

දුෂ්ඨයා තමාගේ මාර්ගයද අධර්මිෂ්ඨ මනුෂ්‍යයා තමාගේ යෝජනාද අත්හැර, ස්වාමින්වහන්සේ වෙතට හැරී ඒවා. උන්වහන්සේ ඔහුට අනුකම්පා කරනවා ඇත; අපේ දෙවියන්වහන්සේ වෙතට ඔහු හැරී ඒවා, මක්නිසාද උන්වහන්සේ අතිශයින් කමා වෙනවා ඇත.

ක්‍රියා 5 : 31

ඉශ්‍රායෙල්ට පශ්චාත්තාපයත් පව් කමාවත් දෙන අධිපතියෙක්ද ගැළවුම්කාරයෙක්ද වන පිණිස දෙවියන්වහන්සේ තමන්ගේ දකුණතින් උන්වහන්සේව උසස් කළසේක.

මාර්ක් 2 : 5

යේසුස්වහන්සේ ඔවුන්ගේ ඇදහිල්ල දැක : පුත්‍රය, නුඹේ පව් කමා කරන ලදැයි අංශභාග රෝගියාට කීසේක.

# ලෞකිකත්වයෙන් වෙන්වීම



තීතස් 2 : 11,12

මක්නිසාද සියලු මනුෂ්‍යයන්ට ගැළවීම ගෙනෙන්නාවූ දෙවියන්වහන්සේගේ කරුණාව ප්‍රකාශ වී තිබේ. අභක්තිකකමද, ලෞකික තෘෂ්ණාද එපාකර. . . සිහියෙන් යුක්තව ධර්මිෂ්ඨ ලෙසද භක්තිවන්ත ලෙසද මේ ලෝකයෙහි ජීවත්වන පිණිස ඒ කරුණාව අප අනුමත කරන්නේය.

කොලොස්සි 3 : 2

පොළොවේ තිබෙන දේ නොව, උසස් තැන්හි තිබෙන දෙයම සළකන්න.

එපීස 5 : 11

අන්ධකාරයේ එල නැති ක්‍රියාවලට හවුල් නොවී, ඒවාට දෙස් තබන්න.

යෙසායා 1 : 16

නුඹලා සෝදගෙන පවිත්‍ර වෙන්න. නුඹලාගේ ක්‍රියාවල නපුරුකම මාගේ ඇස් ඉදිරියෙන් පහකර, නපුරුකම් කිරීමෙන් වැළකෙන්න.

1 යොහන් 2 : 15, 16

ලෝකයටවත් ලෝකයෙහි තිබෙන දේවලටවත් ප්‍රේම නොකරන්න. යමෙක් ලෝකයට ප්‍රේම කරයි නම් පියාණන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුළ නැත. මක්නිසාද ලෝකයෙහි තිබෙන සියල්ල, එනම්, මාංසයේ තෘෂ්ණාවත් ජීවිතයේ අහංකාරකමත් පියාණන්වහන්සේගෙන් නොව, ලෝකයෙන්ය.

එසකියෙල් 36 : 26

මම අලුත් සිතක් නුඹලාට දී, අලුත් ආත්මයක් නුඹලා තුළ තබා, නුඹලාගේ මාංසයෙන් ගල් සිත පහකොට, මාංසමය වූ සිතක් නුඹලාට දෙන්නෙමි.

1 යොහන් 2 : 29

උන්වහන්සේ ධර්මිෂ්ඨ බව නුඹලා දනිහු නම් ධර්මිෂ්ඨකම් කරන සියල්ලන්ද උන්වහන්සේගෙන් ඉපදී සිටින බව දනිහුය.

2 කොරින්ති 5 : 17

එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය; මෙන්න සියල්ලම අලුත් වී තිබේ.

1 යොහන් 5 : 18

දෙවියන්වහන්සේගෙන් ඉපදී සිටින කිසිවෙක් පව් නොකරන බව අපි දනිමුව; එහෙත් දෙවියන්වහන්සේගෙන් උපන් තැනැත්තේ තමාම ආරක්ෂාකර ගන්නේය, නපුරා ඔහුට අතගසන්නේ නැත.

යොහන් 3 : 3

යේසුස්වහන්සේ උත්තර දෙමින් : සැබවක් සැබවක් නුඹට කියමි. යමෙක් අලුතෙන් නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්ට නොහැකි යයි ඔහුට කීසේක.

1 පේත්‍රුස් 1 : 23

මක්නිසාද නුඹලා කුණුවෙන බීජවලින් නොව දෙවියන්වහන්සේගේ ජීවමාන පවතින්නාවූ වචනය කරණකොටගෙන, කුණු නොවෙන බීජවලින් නැවත උත්පාද කරනු ලැබුවහුය.

එපීස 2 : 1 සහ 6

නුඹලා නුඹලාගේ වරද සහ පාප කරණ කොටගෙන මැරී සිටි කල උන්වහන්සේ නුඹලා ජීවත් කළසේක. . . උන්වහන්සේ අප නැගුටුවා, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ස්වර්ගීයවූ ස්ථානවල උන්වහන්සේ සමග අප හිඳවූසේක.

කොලොස්සි 3 : 1

ඉතින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේ සමග නැඟුටුවන ලද්දහු නම් උසස් තැන්හි තිබෙන දේවල් සොයන්න. එහි ක්‍රිස්තුස් වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ වැඩහිඳිනසේක.

1 පේත්‍රුස් 2 : 24

අප පාපවලට නැසී ධර්මිෂ්ඨකමට ජීවත් වන පිණිස, උන්වහන්සේම තමන්ගේ ශරීරයෙන් ගස පිට අප පාපයන් ඉසිලූසේක; උන්වහන්සේගේ තුවාළවලින් නුඹලා සුවකරනු ලැබුවහුය.

ගලාති 5 : 24

තවද ක්‍රිස්තුස්වහන්සේට අයිති අය ආසා සහ තෘෂ්ණා සමග මාංසය කුරුසියෙහි ඇණගැසූහ.

රෝම 6 : 2 සහ 11

පාපයට මළාවූ අපි තවත් එහි කෙසේ ජීවත් වෙමුද?. . . එලෙසම නුඹලාත් පාපයට මැරී සිටින්නන් කොටද, අප ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේට ජීවත්ව සිටින්නන් කොටද සිතාගන්න.

# සදාකාල ජීවනය

### ගලාති 6 : 8

ඒ හැටියට තමාගේ මාංසය සඳහා වපුරන්නා මාංසයෙන් කුණුවීම කපාගන්නේය. ආත්මයාණන්වහන්සේ සඳහා වපුරන්නා, ආත්මයාණන්වහන්සේගෙන් සදාකාල ජීවනය කපාගන්නේය.

### යොහන් 3 : 14,15

මෝසෙස් කාන්තාරයේදී සර්පයා එසවූ ලෙසම මනුෂ්‍ය පුත්‍රයාද, උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම, සදාකාල ජීවනය ලබන පිණිස ඔසවනු ලබන්ට ඕනෑයයි කීසේක.

### යොහන් 17 : 3

සදාකාල ජීවනය මේය: එකම සැබෑවූ දෙවියන්වහන්සේ වන ඔබ සහ ඔබ විසින් එවන ලද තැනැත්තා වන යේසුස් ක්‍රිස්තුස් ඔවුන් විසින් ඇඳිනගැනීමය.

### යොහන් 3 : 36

පුත්‍රයාණන් කෙරෙහි අදහන්නාට සදාකාල ජීවනය ඇත. නුමුත් පුත්‍රයාණන්ට කීකරු නොවන්නා ජීවනය නොදක්නේය, දෙවියන්වහන්සේගේ උදහස ඔහු කෙරෙහි පවතියි.

### රෝම 6 : 23

මක්නිසාද පාපයේ කුලී නම් මරණයය; නුමුත් දෙවියන්වහන්සේගේ දීමනාව නම්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්-වහන්සේ තුළ සදාකාල ජීවනයය.

### යොහන් 5 : 24

සැබවක් සැබවක් නුඹලාට කියමි. මගේ වචනය අසා මා එවූ තැනැන්වහන්සේ අදහන්නාට සදාකාල ජීවනය තිබේ. ඔහු විනිශ්චයට පත් නොවී මරණය කෙරෙන් ජීවනයට පැමිණ සිටියි.

යෙසායා 32 : 17

ධර්මිෂ්ඨකමේ ක්‍රියාව සමාදනයද ධර්මිෂ්ඨකමේ ඵල, සදකාල ශාන්තිය හා සුරක්ෂිතභාවයද වන්නේය.

ගලාති 4 : 6

තවද නුඹලා පුත්‍රයන්ව සිටින බැවින් අබ්බා පියාණෙනි කියා හඩගසන්නාවූ සිය පුත්‍රයාණන්ගේ ආත්මය දෙවියන්වහන්සේ අප සිත්වලට එවූසේක.

යොහන් 14 : 21

යමෙක් මාගේ ආඥා පිළිගෙන රක්ෂා කෙරේද, මට ප්‍රේම කරන්නේ ඔහුය. මට ප්‍රේම කරන්නා මාගේ පියාණන් විසින් ප්‍රේම කරනු ලබන්නේය. මමද ඔහුට ප්‍රේම කොට ඔහුට ප්‍රකාශ වන්නෙමියි කීසේක.

රෝම 8 : 16

අපි දෙවියන්වහන්සේගේ දරුවන් බවට ආත්මයාණන්වහන්සේ අපේ ආත්මය සමග එක්ව සාක්ෂි දෙනසේක.

1 යොහන් 3 : 18,19

මාගේ ප්‍රිය දරුවෙනි, වචනයෙන් හෝ දිවෙන් නොව, ක්‍රියාවෙන් හා සැබෑවෙන් ප්‍රේම කරමු. මෙයින් අප සැබෑවෙන් වන බව දැන අප සිත් අපට දෝෂාරෝපණය කරන විට උන්වහන්සේ ඉදිරියෙහි අපේ සිත් සහතික කරන්නෙමුව;

1 යොහන් 4 : 13

අප උන්වහන්සේ තුළද උන්වහන්සේ අප තුළද සිටින බව අප විසින් දැනගන්නේ උන්වහන්සේ තමන්ගේ ආත්මයාණන් අපට දී තිබෙන නිසාය.

යොහන් 17 : 13

දැන් මා ඔබ ළඟට එමි. මා ලෝකයේදී මේ දේවල් කථාකරන්නේ මාගේ ප්‍රීතිය ඔවුන් තුළ සම්පූර්ණයෙන් ඉෂ්ට වන පිණිසය.

රෝම 14 : 17

මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය කෑමෙන් බීමෙන් නොව, නුමුත්, ධර්මිෂ්ඨ-කමින්ද, ශුද්ධාත්මයාණන් තුළ ප්‍රීති-යෙන්ද වෙයි.

ගලාති 2 : 20

මම ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි—එසේ වී නුමුත් මම ජීවත් වෙමි; නුමුත් තවත් මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා තුළ ජීවත්වනසේක. තවද මා දැන් මාංසයෙහි ජීවත්වන ජීවිතය මට ප්‍රේම කළාවූ, මා උදෙසා තමන්ම පාවා දුන්නාවූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත්වෙමි.

යෙසායා 12 : 3

එබැවින් නුඹලා ප්‍රීතියෙන්, ගැළවීමේ ළිංවලින් දිය ඇදගන්නහුය.

යොහන් 15 : 11

මාගේ ප්‍රීතිය නුඹලා තුළෙහි පවතින පිණිසද නුඹලාගේ ප්‍රීතිය සම්පූර්ණ වන පිණිසද මේ දේවල් නුඹලාට කියමි.

ගීතාවලිය 16 : 11

ඔබ මට ජීවන මාර්ගය පෙන්වනසේක. ඔබ අභිමුඛයෙහි ප්‍රීතියේ සම්පූර්ණකම ඇත්තේය; ඔබගේ දකුණු පැත්තෙහි සදාකාලේටම සැපත ඇත්තේය.

# ස්වාමින්වහන්සේට කීකරුවීම අවශ්‍යයි

1 සාමුවෙල් 12 : 15

නුමුත් නුඹලා **ස්වාමින්වහන්සේගේ** හඬට ඇහුම්කන් නොදී **ස්වාමින්වහන්සේගේ අණට** විරුද්ධව කැරළි ගසන්නහු නම් **ස්වාමින්වහන්සේගේ** හස්තය නුඹලාගේ පියවරුන්ට විරුද්ධව තිබුණාක් මෙන් නුඹලාටත් විරුද්ධ වන්නේය.

රෝම 6 : 16

නුඹලා කීකරුකම පිණිස දසයන් වී යමෙකුට නුඹලාම භාර වෙන්නහුද, එය මරණයට පමුණුවන්නාවූ පාපය වේවා, ධර්මිෂ්ඨකමට පුමුණුවන්නාවූ කීකරුකම වේවා, නුඹලා කීකරුවන අයට දසයන් වන බව නොදනිව්ද?

2 තෙසලෝනික 1 : 6 – 10

මක්නිසාද, ස්වාමිවූ යේසුස්වහන්සේ සිය පරාක්‍රමයේ දූතයන් හා ඇවිලෙන ගින්නෙන් යුතුව ස්වර්ගයෙන් එළිදරව් වී දෙවියන්වහන්සේ නාඳුනන්ට හා අප ස්වාමිවූ **යේසුස් ක්‍රිස්තුස්වහන්සේට** කීකරු නොවෙන්නන්ට ප්‍රතිවිපාක දෙන කල......... දුක්විඳින ඔබලා අප හා සහනය ලබන්න........ ඒඅය ස්වාමින්වහන්සේගේ අභිමුඛයෙන්ද උන්වහන්සේගේ බලයේ තේජසින්ද සදාකාල විනාශයේ දඬුවම විඳින්නෝය.

ද්විතීය 11 : 26 – 28

අද මම නුඹලා ඉදිරියේ ආශිර්වාදයක් හා සාපයක් තබමි. අද නුඹලාට අණ කරන නුඹලාගේ දෙවි වූ **ස්වාමින්වහන්සේගේ** ආඥාවලට නුඹලා කීකරු වූ කල, ආශිර්වාදයකි; නුඹලාගේ දෙවි වූ **ස්වාමින්වහන්සේගේ** ආඥාවලට අකීකරු වූ කල, සාපයකි.

# ක්‍රිස්තුස්වහන්සේව ප්‍රකාශ කිරීම අවශ්‍යයි

පිලිප්පි 2 : 11

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමින්වහන්සේ බව පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා සියලු දිව්වලින් ප්‍රකාශ කරන පිණිසත්ය.

මතෙව් 10 : 32,33

එබැවින් මනුෂ්‍යයන් ඉදිරියේ : ඔහු අඳුනමියි මා ගැන කියන යමෙක් ඇද්ද, ස්වර්ගයේ සිටින මාගේ පියාණන්වහන්සේ ඉදිරියේදී මමත් : ඔහු අඳුනමියි කියන්නෙමි. නුමුත් මනුෂ්‍යයන් ඉදිරියේදී ඔහු නාඳුනමියි මා ගැන කියන යමෙක් ඇද්ද, ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේ ඉදිරියේදී මමත් : ඔහු නාඳුනමියි කියන්නෙමි.

රෝම 10 : 9,10

මක්නිසාද, යේසුස්වහන්සේ ස්වාමින්වහන්සේ යයි නුඹේ මුඛයෙන් ප්‍රකාශ කරන්නෙහි නම් දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටවූ බව සිතින් අදහන්නෙහි නම් නුඹ ගළවනු ලබන්නෙහිය. මක්නිසාද මනුෂ්‍යයා ධර්මිෂ්ඨකම පිණිස සිතින් අදහන්නේය; ගැළවීම පිණිස මුඛයෙන් ප්‍රකාශ කරන්නේය.

2 යොහන් 2 : 23

යමෙක් පුත්‍රයාණන්වහන්සේව එපා කරන්නේද, ඔහුට පියාණන්වහන්සේ නැත්තේය. යමෙක් පුත්‍රයාණන්වහන්සේව පිළිගන්නේද ඔහුට පියාණන්වහන්සේ ඇත්තේය.

# සාතන් – අප පරම හතුරාය

1 පේත්‍රුස් 5 : 8

සිහි ඇතිව, අවදිව සිටින්න. නුඹලාගේ නතුරා වන යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිම්ද සොයමින් ඔබ මොබ ඇවිදින්නේය.

මතෙව් 4 : 1 සහ 10, 11

එකල යේසුස්වහන්සේ යක්ෂයා විසින් පරික්ෂා කරනු ලබන පිණිස ආත්මයාණන් වහන්සේ විසින් වනාන්තරයට පමුණුවනු ලැබුසේක. . . එවිට යේසුස්වහන්සේ : සාතන් අහක්ව යව. මක්නිසාද නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේට නමස්කාර කරත්වා කියාද උන්වහන්සේට පමණක් සේවය කරත්වා කියාද ලියා තිබේ යයි ඔහුට කීසේක. එකල යක්ෂයා උන්වහන්සේ අත්හැර ගියේය; බලව, දේවදූතයෝ පැමිණ උන්වහන්සේට උපස්ථාන කළෝය.

2 තෙසලෝනික 2: 9

ඔහුගේම ඊම සාතන්ගේ ක්‍රියා අනුව, පුදුමවලින්ද, ලකුණුවලින්ද බොරු හාස්කම්වලින්ද යුක්තය.

එපීස 6 : 11

යක්ෂයාගේ උපායන්ට විරුද්ධව සිටින්ට නුඹලාට පුළුවන් වන පිණිස දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳගන්න.

ක්‍රියා 26 : 17ආ, 18

මා කෙරෙහි ඇදහීමෙන් ඔවුන්ට පව් කමාව හා පිරිසිදු කළ අය අතරෙහි උරුමයක් ලබන පිණිසද ඔවුන්ව අඳුරෙන් ආලෝකයට හා සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙතට හැරෙන පිණිසද ඔවුන්ගේ ඇස් පහදන්ටත්ය.

# සාතන්ගෙන් ජය

2 තෙසලෝනික 2 : 8

එවිට නපුරා එළිදරව් වෙයි. ස්වාමීන් වහන්සේ සිය මුඛයේ හුස්මෙන් ඔහු නසා තම ඊමේ ප්‍රකාශ වීමෙන් විනාශ කරනසේක.

යාකොබ් 4 : 7,8අ

දෙවියන්වහන්සේට යටත් වෙන්න. යක්ෂයාට විරුද්ධව සිටින්න. එවිට ඔහු නුඹලා වෙතින් පලා යනවා ඇත. දෙවියන්වහන්සේට ළං වෙන්න. එවිට උන්වහන්සේ නුඹලාට ළං වනසේක.

හෙබ්‍රෙව් 2 : 14

එහෙයින් දරුවන් ලේ හා මාංසයට පංගුකාරයන්ව සිටින නිසා උන්වහන්සේත් එලෙස ඒවාට පංගුකාරයෙක් වූසේක. එසේ කළේ මරණයේ බලය ඇති යක්ෂයාව, මරණය තුළින් විනාශ කිරීමටය.

රෝම 8 : 35 සහ 37

ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන් කරන්නේ කවුද? විපතවත්, සිත්, වේදනාවවත්, පීඩාවවත්, දුර්භික්ෂයවත් නිර්වස්ත්‍රකමවත්, උපද්‍රවයවත්, කඩුවවත් අප වෙන් කරන්නේද?. . . නුමුත් අපට ප්‍රේම කළාවූ තැනැන්වහන්සේ කරණකොටගෙන අපි මේ සියල්ලේදී අතිශයින්ම ජයගන්නෝ වෙමුව.

1 යොහන් 3 : 8

පව් කරන තැනැත්තේ යක්ෂයාගෙන්ය. මක්නිසාද යක්ෂයා පටන්ගැන්මේ සිට පව් කරන්නේය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ප්‍රකාශ කරනු ලැබුවේ මේ පිණිසය, එනම් යක්ෂයාගේ ක්‍රියා විනාශ කරන පිණිසය.

# ප්‍රේමය ගෝලත්වයේ පරීක්ෂණයයි

1 යොහන් 4 : 20

යමෙක්, දෙවියන්වහන්සේට ප්‍රේම කරමියි කියා තම සහෝදරයාට වෛර කරයි නම් ඔහු බොරුකාරයෙකි. මක්නිසාද, ඔහු දුටු සහෝදරයාට ප්‍රේම නොකරනවා නම් ඔහු නුදුටු දෙවියන්වහන් සේට ඔහුට ප්‍රේම කරන්න නුපුළුවන.

1 කොරින්ති 13 : 1

මම මනුෂ්‍යයන්ගේද දේවදූතයන්ගේද භාෂාවලින් කථා කරන්නෙම් නුමුත්, මට ප්‍රේමය නැත්නම්, මම හඬනගන පිත්තලට නොහොත් ශබ්ද නගන අත්තලකට සමාන වී සිටිමි.

යොහන් 13 : 35

නුඹලා එකිනෙකාට ප්‍රේම කරනවා නම් නුඹලා මාගේ ගෝලයෝ බව එයින් සියල්ලන් දැනගන්නවා ඇතැයි කීසේක.

ගලාති 5 : 22,23අ

ආත්මයාණන්ගේ ඵල නම්, ප්‍රීතිය, ප්‍රේමය, සාමය, ඉවසීම, කරුණාව, යහපත්කම, විශ්වාසය, මෘදුකම හා පමණ දැන ක්‍රියා කිරීමය.

යොහන් 21 : 16

නැවතත් දෙවෙනි වරත් : යොහන්ගේ පුත්‍ර සීමොන්, නුඹ මට ප්‍රේම කරනවාදැයි ඔහුගෙන් ඇසූසේක. ඔහු : එසේය ස්වාමිනි, මා ඔබට ආදරේ බව ඔබ දන්නාසේකැයි උන්වහන්සේට කීවේය. උන්වහන්සේද : මාගේ බැටළුවන් පාලනය කරන්නැයි ඔහුට කීසේක.

1 යොහන් 3 : 14

අප සහෝදරයන්ට ප්‍රේම කරන බැවින් අප මරණින් ජීවනයට පැමිණ සිටින බව අපි දනිමුව. ප්‍රේම නොකරන තැනැත්තේ මරණයෙහි පවතී.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීම

ක්‍රියා 10 : 39 – 41

උන්වහන්සේ, විසින් යුදෙව්වරුන්ගේ රටේද යෙරුසලමේද කළ සියල්ලට අපි සාක්ෂිකාරයෝය. ඔව්හු උන්වහන්සේව ගසක එල්ලා මැරුහ. දෙවියන්වහන්සේ උන්වහන්සේව තෙවන දින නැගුටුවා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළසේක. නුමුත් මුළු සෙනගට නොව, දෙවියන්වහන්සේ කලින් තෝරාගත් සාක්ෂිකාරයන් වන උන්වහන්සේ මළවුන්ගෙන් නැගුටුණු පසු උන්වහන්සේ සමග කෑවාවූ බීවාවූ අපටමය.

රෝම 4 : 25

උන්වහන්සේ වනාහි අපේ වරද නිසා පාවා දෙනු ලැබ, අප ධර්මිෂ්ඨ කොට ගණන්ගනු ලැබීම සඳහා නැගුටුවනු ලැබූසේක.

යොහන් 20 : 26 – 28

අට දවසකට පසු උන්වහන්සේගේ ගෝලයෝ නැවතත් ගේ ඇතුළෙහි සිටියෝය, තෝමස්ද ඔවුන් සමග සිටියේය. දොරවල් වසා තිබියදී යේසුස්වහන්සේ පැමිණ මැද සිට: නුඹලාට සාමය වේවයි කීසේක. එකල උන්වහන්සේ තෝමස්ට කථා කොට: නුඹේ ඇඟිල්ල මෙහි දිගු කොට මගේ අත් බලන්න; නුඹේ අත දිගුකොට මාගේ ඇලයට දමන්න. අවිශ්වාස නොකර විශ්වාස කරන්නැයි කීසේක. තෝමස් උත්තර දෙමින්: මාගේ ස්වාමිනි, මාගේ දෙවියනියි උන්වහන්සේට කීවේය.

මාර්ක් 16 : 9

උන්වහන්සේ සතියේ පළමු දින අලුයම් වේලේ නැගිට පළමුව මග්දලායේ මරියාට පෙණුනුසේක. ඈ වනාහි උන්වහන්සේ විසින් යක්ෂයන් සත් දෙනෙකු දුරු කරනු ලැබූ තැනැත්තීය.

මතෙව් 16 : 21

එවක් පටන් යේසුස්වහන්සේ, තමන් යෙරුසලමට ගොස් වැඩිමහල්ලන්ගෙන්ද නායක පූජකයන්ගෙන්ද ලියන්නන්ගෙන්ද බොහෝ දේ විඳින්ටත් මරනු ලබන්ටත් තුන්වෙනිද නැගුටුවනු ලබන්ටත් ඕනෑ බව ගෝළයන්ට දන්වන්ට පටන්ගත්සේක.

යොහන් 5 : 25 සහ 28,29

සැබවක් සැබවක් නුඹලාට කියමි. දෙවියන්වහන්සේගේ පුත්‍රයාගේ හඬ මළවුන්ට ඇසෙන පැය පැමිණෙන්නේය. දැනුත් පැමිණ තිබේ. අසන අය ජීවත් වන්නෝය. . . මේ ගැන මවිත නොවෙන්න. මක්නිසාද සොහොන් ගෙවල්හි සිටින සියල්ලන්ට ඔහුගේ හඬ ඇසෙන පැය පැමිණ, යහපත්කම් කළාහු ජීවනයේ නැවත නැගිටීමටත්, නපුරුකම් කළාහු විනිශ්චයේ නැවත නැගිටීමටත් පිටත්ව එන්නෝය.

රෝම 6 : 3 – 5

නොහොත් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළට බව්තීස්ම ලැබුවාවූ අප සියල්ලන් උන්වහන්සේගේ මරණයට බව්තීස්ම ලැබූ බව නුඹලා නොදැන සිටිත්ද? එබැවින් ක්‍රිස්තුස්වහන්සේ පියාණන්වහන්සේගේ මහිමය කරණකොටගෙන මළවුන්ගෙන් නැගුටුවනු ලැබුවා සේම, අපිත් ජීවනයේ අලුත්කමෙන් හැසිරෙන පිණිස මරණය තුළට, බව්තීස්මය කරණකොටගෙන උන්වහන්සේ සමග තැන්පත් කරනු ලැබුවෙමුව. මක්නිසාද උන්වහන් සේගේ මරණයේ සමානත්වයෙන් අපි උන්වහන්සේට සම්බන්ධ වී සිටිමු නම් උන්වහන්සේගේ නැගිටීමේ සමානත්වයෙනුත් සම්බන්ධ වෙන්නෙමුව.

# ස්වාමින්වහන්සේ වෙත ශුද්ධත්වය

ලූක් 1 : 72,73

මෙසේ උන්වහන්සේ අපේ සතුරන්ගේ අත්වලින් අප ගළවා, අපේ සියලු දවස්වල භයක් නැතුව උන්වහන්සේ ඉදිරියෙහි ශුද්ධකමින්ද ධර්මිෂ්ඨකමින්ද උන්වහන්සේට සේවය කරන්ට වරම් දෙන පිණිස අපි අයදිමු.

2 කොරින්ති 7 : 1

එබැවින් ප්‍රේමවන්තයෙනි, මේ පොරොන්දු අපට තිබෙන නිසා, මාංසයේද ආත්මයේද සියලු කිලුටුකම්වලින් අපම පවිත්‍ර කර ගනිමින්, දෙවියන්වහන්සේ කෙරෙහි භයින් යුක්තව ශුද්ධකම සම්පූර්ණ කරගනිමු.

2 තිමෝති 2 : 21

එබැවින් යමෙක් මේවා අත්හැර තමාම පවිත්‍ර කරගනියි නම් ඔහු පිරිසිදු කරගනු ලැබූ, ස්වාමියාගේ පාවිච්චියට සුදුසු, සියලු යහපත් වැඩවලට සූදානම් ගෞරවය පිණිස ඇති භාජනයක් වන්නේය.

1 පේත්‍රුස් 1 : 2

ආත්මයාණන්වහන්සේගේ පිරිසිදු කිරීමෙන් කීකරුවීමටත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ ඉසිනු ලැබීමටත් පියවූ දෙවියන්වහන්සේගේ පෙර දැනගැන්මේ ප්‍රකාරයට තෝරාගනු ලැබූවන්ට ලියා එවන වග නම් : අනුග්‍රහයත් සමාදානයත් නුඹලාට වැඩි වේවා.

1 පේත්‍රුස් 1 : 15

නුඹලා කැඳවූ තැනැන්වහන්සේ ශුද්ධව සිටින්නාක් මෙන් නුඹලාත් නුඹලාගේ මුළු හැසිරීමේදී ශුද්ධව සිටින්න.

# ස්වාමින්වහන්සේ වෙත ශුද්ධත්වය

යෙසායා 35 : 8

අපි වනාහි අපේ පියවූ රේකාබ්ගේ පුත්‍රවූ යෝනාදබ් අපට අණ කළ සියල්ල ගැන ඔහුගේ හඬට කීකරුවීමුව, කිසිකලක අපිවත් අපේ භාර්යාවෝවත් අපේ පුත්‍රයෝවත් අපේ දූවරුවත් මුද්‍රිකපානය නොබීවහුය.

හෙබ්‍රෙව් 13 : 12

එහෙයින් යේසුස්වහන්සේත් තමන්ගේම ලෙයින් සෙනග පිරිසිදු කරන පිණිස දොරටුවෙන් පිටතදී වධ වින්දසේක.

1 යොහන් 1 : 9

අපේ පව් අපට කමා කරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක.

මතෙව් 3 : 11

මම වනාහි පසුතැවිල්ල පිණිස නුඹලා වතුරෙන් බව්තීස්ම කරමි. නුමුත් මට පසුව එන තැනැත්තේ මට වඩා බලවත්ය. මම උන්වහන්සේගේ වහන් ගෙනයන්ටවත් නොවටිමි. උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන්ද, ගින්නෙන්ද නුඹලා බව්තීස්ම කරනසේක.

එපීස 1 : 4

ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප තෝරාගත් ලෙසම, උන්වහන්සේ තුළ ස්වර්ගීය ස්ථානවල සියලු ආත්මික ආශිර්වාදවලින් උන්වහන්සේ අපට ආශිර්වාද කළසේක.

# ආත්මයෙන් පිරුණු මනුෂ්‍යයන්

### ලූක් 11 : 13

මෙසේ නපුරුවූ නුඹලා නුඹලාගේ දරුවන්ට යහපත් දේ දෙන්ට දනිවූ නම් කොපමණ වැඩියෙන් නුඹලාගේ ස්වර්ගීය පියාණන්වහන්සේ තමන්වහන්සේගෙන් ඉල්ලන්නන්ට ශුද්ධාත්මය නොදෙන සේක්දැයි කීසේක.

### ක්‍රියා 1 : 8

නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කළ නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා . . . මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. . .

### එසකියෙල් 36 : 27

නුඹලා මාගේ පනත් ප්‍රකාර හැසිර මාගේ විනිශ්චයන් පවත්වමින් ඒවා කරන්ට සලස්වන්නෙමි.

### රෝම 8 : 9

නුමුත් නුඹලා තුළ දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ වාසය කරනසේක් නම් නුඹලා මාංසයෙහි නොව ආත්මයෙහි සිටින්නෝය. ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ යම් කෙනෙකුට නැත්නම් ඔහු උන්වහන්සේට අයිති නැත.

### ක්‍රියා 13 : 52

ගෝලයෝ ප්‍රීතියෙන්ද, ශුද්ධාත්මයෙන්ද පූර්ණ වූහ.

### ක්‍රියා 4 : 31

ඔවුන් යාඥා කළ පසු, ඔවුන් රැස්ව සිටි ස්ථානය කම්පා විය. ඔවුන් සියල්ලෝද ශුද්ධාත්මයෙන් පූර්ණව, දෙවියන්වහන්සේගේ වචනය නිර්භීත ලෙස කථා කළෝය.

ගීතාවලිය 34 : 18

**ස්වාමින්වහන්සේ** බිඳුණු සිත් ඇති අයට ළංව සිටිනසේක. තැළුණු ආත්ම ඇති අයව ගළවනසේක.

යෙසායා 66 : 2

මේ සියල්ල මාගේ අතින් සාදන ලද්දේය. එසේය, මේ සියල්ල සිදුවීයයි **ස්වාමින්වහන්සේ** කියනසේක. එහෙත් යටහත්, තැළුණු ආත්මයක් ඇත්තාවූ මාගේ වචනයට වෙවුලන්නාවූ මනුෂ්‍යයා දෙස බලමි.

එළිදරව් 21 : 4

උන්වහන්සේ ඔවුන්ගේ ඇස්වලින් සියළු කඳුළු පිස දමනසේක; මරණය තවත් නොවන්නේය. වැළපීමත් හැඬීමත් වේදනාවත් තවත් නොවන්නේය. මක්නිසාද පළමු දේවල් පහව ගියේය.

ගීතාවලිය 37 : 3

**ස්වාමින්ව** විශ්වාසකර යහපත කරන්න. මෙසේ දේශයෙහි වාසය කරමින් විශ්වාසකම අනුව යන්න.

1 පේත්‍රුස් 4 : 12,13

ප්‍රේමවන්තයෙනි, නුඹලා සෝදිසි කිරීම පිණිස පැමිණෙන නුඹලා අතරේ තිබෙන ගිනිවැනි පීඩාව නුඹලාට අමුතු දෙයක් සිදුවෙන්නාක් මෙන් පුදුම නොවෙන්න. නුමුත් ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ එළිදරව් වීමේදී නුඹලා ඉතා මහත් ප්‍රීතියකින් ප්‍රීති වන පිණිස උන්වහන්සේගේ දුක් විඳීමෙහි නුඹලා පංගුකාරයන් වන ප්‍රමාණයට ප්‍රීති වෙන්න.

# පරීක්ෂාකරනු ලැබූ අයට පොරොන්දු

හෙබ්‍රෙව් 2 : 18

මක්නිසාද උන්වහන්සේම පරීක්ෂා කරනු ලැබ දුක්වින්ද බැවින් පරීක්ෂා කරනු ලබන්නන්ට පිහිටවෙන්ට උන්වහන්සේට පුළුවන.

රෝම 16 : 20

සාමයේ දෙවියන්වහන්සේද නොබෝ කලකින් සාතන්ව නුඹලාගේ පා යට දමා පොඩි කරනසේක.

ගීතාවලිය 34 : 19

ධර්මිෂ්ඨයාගේ පීඩා බොහෝය. නුමුත් ස්වාමින්වහන්සේ ඒ සියල්ලෙන් ඔහු ගළවනසේක.

යෙසායා 43 : 2

නුඹ ජල මැදින් යන විට මම නුඹ සමග සිටින්නෙමි; නුඹ ගංගා මැදින් යන විට ඒවා නුඹට උඩින් ගලායන්නේ නැත. නුඹ ගිනි මැදින් යන විට දැවෙන්නේ නැත; ගිනිදැල්ල නුඹ කෙරෙහි ඇවිලෙන්නේ නැත.

රෝම 8 : 28

තවද දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට, සියලු දේම යහපත පිණිස එකට ක්‍රියා කරන බව අපි දනිමුව.

1 කොරින්ති 10 : 13

මනුෂ්‍යයා විසින් ඉසිලිය හැකි පරීක්ෂාවක් මිස අනිකක් නුඹලාට පැමිණුනේ නැත. නුමුත් දෙවියන්වහන්සේ විශ්වාස කෙනෙක්ය. උන්වහන්සේ නුඹලාගේ පුළුවන්කමට වඩා නුඹලා පරීක්ෂාකරනු ලබන්ට ඉඩ නොදී, නුඹලාට පරීක්ෂාව ඉවසිය හැකි වන පිණිස ඒ හා ගැළවෙන මාර්ගයද සාද දෙනසේක.

# ජයගන්නාට පොරොන්දු

## එළිදරව් 3 : 12

ජයගන්නා මාගේ දෙවියන්වහන්සේගේ මාළිගාවෙහි කණුවක් කරන්නෙමි. ඔහු තවත් එතැනින් පිටතට නොයන්නේය. මාගේ දෙවියන්වහන්සේගේ නාමයද මාගේ දෙවියන්වහන්සේ කෙරෙන් ස්වර්ග යෙන් බසින අලුත් යෙරුසලම වන මාගේ දෙවියන්වහන්සේගේ නුවරේ නාමයද මාගේම අලුත් නාමයද ඔහු පිට ලියමි.

## එළිදරව් 3 : 5

ජයගන්නා නම් මෙසේ සුදු වස්ත්‍රයෙන් පළඳවනු ලැබේ. ඔහුගේ නම ජීවන පොතෙන් කිසිසේත් මකා නොහැර, මාගේ පියාණන්වහන්සේද උන්වහන්සේගේ දූතයන්ද ඉදිරියෙහි ඔහුගේ නාමය පිළිගන්නෙමි.

## එළිදරව් 3 : 21

මම ජයගෙන මාගේ පියාණන්වහන්සේ සමග උන්වහන්සේගේ සිංහාසනයෙහි හිඳගත් සේම ජයගන්නාටත් මාගේ සිංහාසනයෙහි මා සමග ඉඳගන්ට දෙමි.

## එළිදරව් 21 : 7

ජයගන්නා සියල්ල උරුමකරගන්නේය; මම ඔහුගේ දෙවියන්වහන්සේ වන්නෙමි. ඔහු මාගේ පුත්‍රයා වන්නේය.

## එළිදරව් 2 : 7

ආත්මයාණන්වහන්සේ සභාවලට කියන දේ කන් ඇත්තෝ අසත්වා. ජයගන්නාට නම් දෙවියන්වහන්සේගේ පරාදීසයෙහි තිබෙන ජීවන වෘක්ෂයෙන් කන්ට දෙන්නෙමි.

1 කොරින්ති 7 : 10,11

නුමුත් විවාහවූවන්ට මම ආඥා කරමි, එහෙත් ආඥා කරන්නේ මා නොව ස්වාමින්වහන්සේය. එනම්, භාර්‍යාව පුරුෂයාගෙන් අහක්ව නොයත්වා. (නුමුත් ඈ අහක්ව ගිය කළ විවාහ නොවී සිටිත්වා. නැතහොත් ඇගේ පුරුෂයා හා සමගිවේවා); පුරුෂයා තමාගේ භාර්‍යාව අත්නාරිත්වා.

ලූක් 16 : 18

තමාගේ භාර්‍යාව අත්හැර වෙන ස්ත්‍රියෙකු සරණපාවාගන්නා කවරෙක් නුමුත් කාමමිථ්‍යාචාරය කරයි. පුරුෂයකු විසින් අත්හරින ලද ස්ත්‍රිය සරණපාවා ගන්න තැනැත්තේද කාමමිථ්‍යාචාරය කරයි.

රෝම 7 : 2 , 3

පුරුෂයකු ඇති ස්ත්‍රිය පුරුෂයා ජීවත්ව සිටින තෙක් ව්‍යවස්ථාවෙන් ඔහුට බැඳී සිටින්නීය; නුමුත් පුරුෂයා මළ විට පුරුෂයාට බැඳී සිටි ව්‍යවස්ථාවෙන් ඈ මිදී සිටින්නීය. පුරුෂයා ජීවත්ව සිටියදී ඈ අන් පුරුෂයෙකු හා විවාහ වූ විට කාමමිථ්‍යාචාරිනියක් යයි කියනු ලබන්නීය. නුමුත් පුරුෂයා මැරුණු පසු ඈ අන් කෙනෙකු හා විවාහ වූ විට ඈ කාමමිථ්‍යාචාරිනියක් නොවන ලෙස ඒ ව්‍යවස්ථාවෙන් නිදහස්ව සිටින්නීය.

මතෙව් 5 : 32

වේශ්‍යාකමට මිස වෙන කාරණයකට තමාගේ භාර්‍යාව අත්හරින කවරෙක් නුමුත් ඇය කාමමිථ්‍යාචාරයට පමුණුවන්නේය. යමෙක් අත්හරිනු ලැබූ අය විවාහ කරගන්නේ නම් ඔහුත් කාමමිථ්‍යාචාරය කරන්නේය.

යොහන් 14 : 3

මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙල කරම් නම් මා සිටින තැන නුඹලාත් සිටින පිණිස මම නැවත පැමිණ නුඹලා මා ළඟට ගන්නෙමි.

එළිදරව් 3 : 11

කිසිවෙක් නුඹේ ඔටුන්න නොගන්නා ලෙස නුඹට තිබෙන දේ තදින් අල්ලා ගන්න.

මාර්ක් 8 : 38

එසේ හෙයින් මේ කාමමිථ්‍යාචාරික පාපිෂ්ඨ පරම්පරාවේදී යමෙක් මා ගැනත් මාගේ වචන ගැනත් ලජ්ජා වන්නේද මනුෂ්‍ය පුත්‍රයා සිය පියාණන්ගේ තේජසින් ශුද්ධ දේවදූතයන් සමග එන කල උන්වහන්සේ ඔහු ගැනත් ලජ්ජා වෙනවා ඇතැයි කීසේක.

මතෙව් 24 : 30

එකල මනුෂ්‍ය පුත්‍රයාගේ ලකුණ අහසේ පෙනෙන්නේය. එවිට පොළොවේ සියලු ගෝත්‍ර වැළපෙන්නෝය; ඔව්හු මනුෂ්‍ය පුත්‍රයා බලයෙන්ද, මහත් තේජසින්ද අහසේ වළාකුල් පිට එනවා දකින්නෝය.

යාකොබ් 5 : 8

ඔබලාත් ඉවසිල්ලෙන් සිටින්න. ස්වාමින්වහන්සේගේ ඊම ළංව තිබෙන නිසා ඔබලාගේ සිත් ස්ථිර කරගන්න.

මතෙව් 24 : 27

මක්නිසාද යම් සේ විදුලිය පෙරදිගින් නික්ම අපරදිග දක්වා පෙනේද, මනුෂ්‍ය පුත්‍රයාගේ ඊමත් එසේම වන්නේය.

# ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන ඊම

1 යොහන් 3 : 2

ප්‍රේමවන්තයෙනි, දැන් අපි දෙවියන්වහන්සේගේ දරුවෝය. අපි කොයි ආකාර අය වන්නෙමුදැයි තවම ප්‍රකාශ වී නැත. උන්වහන්සේ ප්‍රකාශ වුණාම අපි උන්වහන්සේට සමාන වන බව දනිමුව; මක්නිසාද උන්වහන්සේ සිටින ආකාරයටම අපි උන්වහන්සේ දකින්නෙමුව.

එළිදරව් 16 : 15

බලව, මම සොරෙකු මෙන් එමි. නග්නව ඇවිද තමාගේ ලජ්ජාව මනුෂ්‍යයන්ට නොපෙනෙන පිණිස අවදිව සිට තමාගේ වස්ත්‍ර ආරක්ෂා කරගන්නා ආශීර්වාද ලද්දෙක්ය.

ලූක් 12 : 40

එබැවින් නුඹලාත් සූදානම්ව සිටින්න. මක්නිසාද නුඹලා නොසිතන පැයකදී මනුෂ්‍ය පුත්‍රයා එන්නේයයි කීසේක.

ක්‍රියා 1 : 11

ගලීලයේ මනුෂ්‍යයෙනි, නුඹලා ස්වර්ගය දෙස බලමින් සිටින්නේ මක්නිසාද? නුඹ කෙරෙන් ස්වර්ගයට ඔසවා ගනු ලැබූ මේ යේසුස්වහන්සේ ස්වර්ගයට යනවා නුඹලා දුටු ආකාරයෙන්ම එනවා ඇතැයි ඔවුන්ට කීවෝය.

මතෙව් 16 : 27

මක්නිසාද මනුෂ්‍ය පුත්‍රයා තම පියාණන්වහන්සේගේ තේජසින් යුක්තව තමන් දූතයන් සමග එන්නේය; එකල උන්වහන්සේ එකිනෙකාට තම තමාගේ ක්‍රියා ලෙස විපාක දෙනසේක.

ලූක් 21 : 27

එකල මනුෂ්‍ය පුත්‍රයා බලයෙන් හා මහත් තේජසින් යුතුව වලාකුලකින් එනවා ඔවුහු දකින්නෝය.

# දේව වචනය

## ලූක් 21 : 33

අහසත් පොළොවත් පහව යන්නේය; නුමුත් මාගේ වචනය පහව නොයන්නේය.

## මතෙව් 22 : 29

යේසුස්වහන්සේ උත්තර දෙමින් : නුඹලා ශුද්ධ ලියවිලිවත්, දෙවියන්වහන්සේගේ බලයවත් නොදන වරද්ද ගනිහුය.

## 2 පේත්‍රුස් 1 : 21

මක්නිසාද, කිසි අනාගත වාක්‍යයක්, මනුෂ්‍ය කැමැත්තෙන් කිසි කලෙක නොපැමිණියේය. නුමුත් මනුෂ්‍යයෝ ශුද්ධාත්මයාණන් විසින් පොළඹවනු ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස කථා කළෝය.

## 2 තිමෝති 3 : 16

දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදනම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුලු ලියවිල්ල ඉගැන්වීමටත්, තරවටුවටත්, හික්මවීමටත්, ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ.

## ගීතාවලිය 119 : 11

ඔබට විරුද්ධව පව් නොකරන පිණිස ඔබගේ වචනය මාගේ සිතේ නිදනයකරගතිමි.

## ගීතාවලිය 119 : 105

ඔබගේ වචනය මාගේ පාදයන්ට පහනක්ය, මාගේ මාවතට එළියක්ය.

Published in numerous languages by World Missionary Press, Inc. as God supplies funds in answer to prayer. If you would like more copies for prayerful distribution, specify which language(s) you need and how many booklets.

Distributed free of charge by:

**Every Home Crusade, 6 Park Place, Colombo**

Read booklets online or by App
www.wmp-readonline.org

www.wmpress.org

9-17

178 Sinhala HFA